# 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත
# යටතේ සිදුකරනු ලබන්නා වූ සිරභාරයට ගැනීම් හා රඳවා තබාගැනීම් වලට අදාළව
# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# විසින් නිකුත් කරනු ලබන්නා වූ විධිවිධානයන්

2016.05.18

**Human Rights Commission of Sri Lanka**
No. 165, Kynsey Road,
Colombo 08.

## 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ සිදුකරනු ලබන්නා වූ සිරභාරයට ගැනීම් හා රඳවා තබාගැනීම් වලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන්නා වූ විධිවිධානයන්

සිරභාරයට ගනු ලැබූ හා රඳවා ගනු ලැබූ පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් ගරු කිරීමට හා ආරක්‍ෂා කිරීමටත් එවැනි පුද්ගලයන්ට මනුෂ්‍යත්වයෙන් යුතුව සැළකීම තහවුරු කිරීම අරමුණු කොට ගෙන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ සිරභාරයට ගැනීම් සිදුකරන්නා වූ නිලධාරීන් විසින් අනුගමනය කිරීම සිදුතළ යුතු විධිවිධානයන් මෙසේ දක්වයි. එකී පනත ඉතා සීමිත ලෙස අර්ථනිරූපනය කළ යුතු අතර එහි ප්‍රතිපාදන යෙදවිය යුතු වන්නේ සීමිත අවස්ථා වලදී පමණි. කිසිවිටක සාමාන්‍ය අපරාධ සඳහා එකී පනත නොයෙදවිය යුතුය.

පෙර වූ රාජ්‍ය නායකයින් විසින් සිරභාරයට ගැනීම් හා රඳවා තබාගැනීම් වලට අදාළව නිකුත් කරන ලද විධිවිධානයන් සහ ශ්‍රී ලංකාව විසින් බැඳී ඇති අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන් මෙම විධිවිධානයන් සඳහා පාදක කොටගෙන ඇත.

### I සිරභාරයට ගැනීමේ ක්‍රියාවලිය

1) නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට හා එසේ සිරභාරයට ගැනීමට හෝ රඳවා තබාගැනීමට නියෝග කළ හැකි නීතියෙන් බලයලත් පුද්ගලයෙකු විසින් කරන ලද විධිවිධානයකට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ සිදුකරනු ලබන්නා වූ සිරභාරයට ගැනීම හෝ රඳවා තබාගැනීම නොකළ යුතුය.

2) සිරභාරයට ගැනීම සිදුකරන අවස්ථාවේ දී

(i) සිරභාරයට ගනු ලැබීම සිදුකරන පුද්ගලයා විසින් සිරභාරයට ගනු ලබන පුද්ගලයා ඔහුගේ ඥාතියෙකු හෝ හිතමිත්‍රාදියෙකුහට තම නම සහ තනතුර දන්වා සිටීමත් තමන්ගේ අනන්‍යතාවය පෙන්වීමත් කළ යුතුය.

(ii) සිරභාරයට ගනු ලබන පුද්ගලයාහට එසේ සිරභාරයට ගැනීමට හේතුව දක්වා සිටිය යුතුය.

(iii) සිරභාරයට ගැනීම හෝ රඳවා තබාගැනීම සිදුකරන පුද්ගලයා විසින් සිරගත කිරීම සිදුකරන ලද බව දක්වමින් කලත්‍රයා, දෙමාපියන් හෝ ඥාතීන්හට රිසිට්පතක් නිකුත් කිරීම සිදුකළ යුතුය. සිරභාරයට ගනු ලැබීම සිදුකරන නිලධාරියාගේ නම සහ තනතුර, සිරභාරයට ගනු ලැබූ දිනය සහ වේලාව සහ එසේ සිරභාරයට ගත් පුද්ගලයා රඳවා තබාගන්නා ස්ථානය එහි දක්වා තිබිය යුතුය. රිසිට්පත ලබන්නා විසින් එය ලැබූ බවට සහතික කිරීම සිදුකළ යුතු අතර සිරභාරයට ගනු ලබන්නා විසින් ද එය අනුඅත්සන් කළ යුතුය. එසේම ඔහුගේ නම, ලිපිනය, හැඳුනුම්පත් අංකය සහ සිරභාරයට ගනු ලැබීමට හේතුව යන තොරතුරු ද රිසිට්පතෙහි දක්වා තිබිය යුතුයි. සිරභාරයට ගනු ලබන පුද්ගලයා එදිනෙදා ජීවිතයේ භාවිතා කරන භාෂාවකින් රිසිට්පත නිකුත් කළ යුතුය.

Human Rights Commission of Sri Lanka
No. 165, Kynsey Road,
Colombo 08.

(iv) සිරභාරයට ගනු ලැබූ බවට රිසිට්පතක් නිකුත් කිරීමට නොහැකිකම පවතින අවස්ථාවකදී, සිරභාරයට ගනු ලැබීම සිදුකරන නිලධාරියා, පොලිස් නිලධාරියෙකු නම් එසේ රිසිට්පතක් නිකුත් කිරීමට නොහැකි ඇයි ද යන්න සවිස්තරාත්මක හේතු දක්වමින් තොරතුරු දැක්වීමේ පොතෙහි සටහනක් තැබීම සිදුකළ යුතුය.

(v) සිරභාරයට ගනු ලැබූ හෝ රඳවා තබාගැනීමකට ලක්වූ පුද්ගලයෙකු එසේ සිරභාරයට ගනු ලැබුයේ තම පවුල හෝ ඥාතිමිත්‍රාදියෙකුගේ අභිමුඛයේ නොවේ නම් තම තොරතුරු පවුලේ සාමාජිකයෙකුට, ඥාතියෙකුට හෝ හිතමිත්‍රාදියෙකුට දැන්වීම සන්නිවේදනය සඳහා අවසර ලබාදිය යුතුය.

3) සිරභාරයට ගනු ලැබූ පුද්ගලයන් රාජකාරි සේවයට යොදා ඇති බවට මනාව හඳුනාගත හැකි වාහන මඟින් ප්‍රවාහනය කිරීම සිදුකළ යුතුය.

4) යම්කිසි වූ දේපලක් එනම් වාහන, පුද්ගලයා මත ඇති දෙය නොවන වෙනත් දේපලක්, සිරභාරයට ගනු ලබන අවස්ථාවේ දී භාරයට ගනු ලැබීම සිදුකරන්නේ නම් එසේ භාරයට ගනු ලැබූ බවට දන්වමින් රිසිට්පතක් එම අවස්ථාවේදී හෝ එම අවස්ථාවේ සිට පැය 24 ක් ඇතුළත සිරභාරයට ගනු ලැබූ පුද්ගලයාගේ පවුලේ සාමාජිකයන්ට හෝ ඥාතියෙකුහට ලබාදීම සිදුකළ යුතුය. එම දේපල පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයේ විස්තරයක් රිසිට්පතෙහි සඳහන් කර තිබිය යුතුය.

5) සිරභාරයට ගනු ලබන පුද්ගලයා සෝදිසිකිරීම් වලට ලක්කිරීමේ දී එය එම පුද්ගලයාගේ මානව ගරුත්වය සුරකිමින්, බලහත්කාරයෙන් හා ප්‍රචණ්ඩකාරීත්වයෙන් තොරව සහ එම පුද්ගලයාගේ පුද්ගලිකත්වයට ඇති අයිතියට ගරු කරමින් සිදුකළ යුතුය.

6) සිරභාරයට ගනු ලැබූ පුද්ගලයාගේ මානව ගරුත්වය සෑම අවස්ථාවකදීම ආරක්ෂා කළ යුතුය.

7) සිරභාරයට ගනු ලබන අවස්ථාවේ දී බලය යෙදවීම පවත්නා රීතියක් වශයෙන් තහනම් කොට ඇත. සිරභාරයට ගනු ලැබීමට එරෙහිව සිදුකරන බලහත්කාරයෙන් යුතු විරෝධය දැක්වීමකදී එසේ වූ විරෝධය මැඩලීම සඳහා අවම බලය භාවිතා කළ හැකිය. කෙසේ වුවද එවැනි අවස්ථාවකදී සිරභාරයට ගනු ලබන තැනැත්තා හට දෘෂ්‍ය වන හෝ දෘෂ්‍ය නොවන තුවාල සිදුවීම වැළැක්වීමට සැළකිලිමත් විය යුතුය.

8) වධහිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට හෝ දඬුවමකට ලක්කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වන අතර එය සෑම අවස්ථාවකටම අදාළ වන සේ තහනම් කොට ඇත.

Human Rights Commission of Sri Lanka
No. 165, Kynsey Road,
Colombo 08.

## II සිරභාරයට ගැනීමේ ක්‍රියාවලිය

9) සිරභාරයට ගනු ලබන තැනැත්තා පොලිස් ස්ථානයට ගෙන එනු ලබන අවස්ථාවේ දී එසේ ගෙන එනු ලබන නිලධාරියාගෙන් වෛද්‍ය සහාය ඉල්ලා සිටියහොත් වහාම ඒ සඳහා කටයුතු කළ යුතුය. සිරභාරයට ගනු ලැබූ පුද්ගලයා එසේ ඉල්ලා සිටීමක් කිරීම සඳහා සුදුසු තත්වයක නොසිටින බවත් නමුත් වෛද්‍ය උපකාර අවශ්‍යතාවයකින් සිටිනා බවත් පොලිස් නිලධාරියාහට හැගෙන්නේ නම් ඔහු හෝ ඇය විසින් වහා ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. මේ පිළිබඳවද එම අවස්ථාවේදි ඔහුගේ හෝ ඇයගේ ශරීරයේ දක්නට ඇති සුළු හා බරපතල තුවාල ඇති නම් ඒවා වල විස්තර ද එම අවස්ථාවේදීම නිල ලේඛණයක අත්‍යාවශ්‍යයෙන් සඳහන් කළ යුතුය.

10) සිරභාරයට ගනු ලබන පුද්ගලයා හැකි ඉක්මනින් අධිකරණ වෛද්‍ය නිලධාරියකු ඉදිරියට පැමිණවිය යුතුය. එසේ පැමිණවීම සිරභාරයට ගැනීමෙන් පැය 48 ක් ඉක්මවා යෑමට පෙර සිදුකළ යුතුය.

11) සිරභාරයට ගනු ලබූ පුද්ගලයා රඳවා තැබියයුත්තේ ගැසට් පත්‍රයේ පල කර ඇති අවසරලත් රැඳවුම් මධ්‍යස්ථානයන්හි පමණි.

12) ප්‍රශ්ණ කිරීමට ලක්කරනා කාලය තුලදී අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයාහට ඔහුගේ හෝ ඇයගේ නීතිඥයන් හමුවීම සඳහා අවසර තිබිය යුතුය. පොලිස් ස්ථානය තුලදී තම සේවාදායකයන් නියෝජනය කිරීමට නීතිඥයින්හට අයිතිවාසිකම් සලසමින් පොලිස්පතිතුමා විසින් නිකුත් කොට ඇති නිර්ණායකයන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිරගත කොට ඇති හෝ රඳවා තබාගෙන ඇති තම සේවාදායකයන් නියෝජනය කරනා නීතිඥයන්හට ද අදාළ වන්නේය.

13) සිරභාරයට ගනු ලැබූ හෝ රඳවා තබාගෙන ඇති පුද්ගලයෙකුගේ ප්‍රකාශයන් සටහන් කළ යුත්තේ එම පුද්ගලයා විසින් කැමැත්ත දක්වන්නා වූ භාෂාවකිනි. යම්කිසි පුද්ගලයෙකු තම අත්අකුරෙන් ප්‍රකාශයක් සටහන් කිරීමට කැමැත්තක් ඇත්තේ නම් ඔහුට හෝ ඇයට ඒ සඳහා අවසර තිබිය යුතුය.

14) රඳවා තබාගැනීම වද හිංසාවක් හෝ නින්දාවක් නොවීම පිණිස ආහාර, මනා වාත්‍රාශ්‍රය, ආලෝකය, මෙට්ට සහ ඇඳ ඇතිරිලි, සනීපාරක්ෂක පහසුකම්, මදුරු දැල් හෝ දඟර වැනි මූලික අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා රැඳවුම් මධ්‍යස්ථානවල ප්‍රමාණවත් ප්‍රතිපාදන පැවතිය යුතුය. රඳවා තබාගැනීම සිදුකරන කාලය තුළදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකමක් වන 13(5) ව්‍යවස්ථාවෙහි දක්වා ඇති නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනය යන ආරක්ෂා කිරීම කළ යුතුය.

15) යම්කිසි පුද්ගලයෙකුට එරෙහිව මානව හිමිකම් කඩකිරීමක් යම්කිස් පුද්ගලයෙකු විසින් කරනු ලබන්නේ නම් (ලිංගික වධහිංසනය, ලිංගික අපයෝජනය සහ ලිංගික බලහත්කාරකම් වැනි ඕනෑම උල්ලංඝනීය ක්‍රියාවක් මෙයට ඇතුළත් වේ), එම පුද්ගලයා වහා යුක්තිය ඉදිරියට පමුණුවන බවටත්, වරදකරු බවට ඔප්පු වුවහොත් තමන් විසින් කරන ලද අපරාධයේ බරපතලභාවයට තත්වයෙන් සමාන නීතිය

Human Rights Commission of Sri Lanka
No. 165, Kynsey Road,
Colombo 08.

විසින් දක්වා ඇති දඬුවම් විඳීමට සිදුවන බවත් පොලිස් සහ සන්නද්ධ සේවයේ නියුතු නිලධාරීන්හට මනාව පැහැදිලි කරමින් දැනුවත් කිරීම කළ යුතුය.

16) යම්කිසි රැඳවියෙකු, තමා ස්ත්‍රී දූෂණයට හෝ ලිංගික අපයෝජනයට ලක්වූ බව ප්‍රකාශකර සිටියහොත් ඔහු හෝ ඇය වහා වෛද්‍ය විභාගයකට යොමු කළ යුතුය. එහිදී එසේ වූ රැඳවියා කාන්තාවක් වන්නේ නම් ඇයට කාන්තා අධිකරණ වෛද්‍ය නිලධාරිණියක විසිනුත්, කාන්තා අධිකරණ වෛද්‍ය නිලධාරිණියක එම ස්ථානයේ නොමැතිනම් අවම වශයෙන් කාන්තාවක් ඉදිරියේදී වෛද්‍ය විභාගය සිදුකිරීම වඩාත් සුදුසු වන්නේය.

## III <u>කාන්තාවන් සහ වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන් සිරභාරයට ගැනීමේදී අනුගමනය කළ යුතු විශේෂ ක්‍රියාමාර්ග</u>

17) සිරභාරයට ගනු ලබමින් සිටින පුද්ගලයා කාන්තාවක හෝ වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකු වන විට එම ස්ථානයේ කාන්තා පොලිස් නිලධාරීන් පෙනී සිටිය යුතුය. ඉර නැගීමත් ඉර බැසීමත් එනම් නිශා කාලය තුළදී කාන්තාවන් සහ ගැහැණු ළමයින් සිරභාරයට ගැනීමෙන් වැළකිය යුතුය.

18) කාන්තාවක් හෝ වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකු සිරභාරයට ගනු ලැබූ විට හෝ රඳවා ඇති විට, ප්‍රශ්න කිරීම සිදුකරන ස්ථානයට තමා කැමති පුද්ගලයෙකු එකී කාන්තාව හෝ වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයා කැටුව යාමට අවසරය තිබිය යුතුය.

19) කාන්තාවක හෝ ගැහැණු ළමයෙකු සෝදිසි කිරීමට ලක්කිරීමේ දී එය කාන්තා නිලධාරිණියක විසින් පමණක් කළ යුතුය, එහිදී ඔවුන්ගේ ගරුත්වය සහ ශාරීරික අනන්‍යතාවය ආරක්ෂා කිරීමට විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එවැනි සෝදිසි කිරීමකදී කාන්තාවක හෝ ගැහැණු ළමයෙකුගේ ඇඳුම් පැළඳුම් ඉවත් කිරීමට අවශ්‍ය වන්නේ නම් එය පුරුෂ පාර්ශවයට දර්ශනය නොවන ස්ථානයක සිදුකළ යුතුය.

20) සිරභාරයට ගැනිම සිදුකරන නිලධාරීන් විසින් ගර්භනී කාන්තාවන් හිංසනයට ලක් නොකරන බවට සහතික විය යුතුය. ගර්භනී කාන්තාවක සෝදිසි කිරීම, සිරභාරයට ගැනීම හෝ රඳවා තැබීම සිදුකරනු ලැබීමේදී පොලිස් සහ හමුදා රාජකාරියේ යෙදී සිටින නිලධාරීන් විසින් ඇයගේ විශේෂ අවශ්‍යතා අවධානයට ගත යුතු අතර ඇයගේ සෞඛ්‍ය තත්වය හෝ මනා පැවැත්මට කුමන ආකාරයකින් හෝ හානි පැමිණිවීමක් සිදුනොවීමට සහතික විය යුතුයි.

21) කාන්තා රැඳවියන් පුරුෂ රැඳවියන්ගෙන් වෙන්ව රඳවා තැබිය යුතුය. එමෙන්ම ස්නානය සහ වැසිකිළි පහසුකම් වෙන්ව පැවතිය යුතුය. (සිරකරුවන්ට සැළකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන්, රීති (8) (අ) ට අනුකූලව)

Human Rights Commission of Sri Lanka
No. 165, Kynsey Road,
Colombo 08.

22) එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන් රීති 53 ට අනුකූලව කාන්තා රැඳවියන් ප්‍රශ්ණ කිරීමට ලක්කරනා කාලය තුළදී එම ස්ථානයේ කාන්තා ආරක්ෂක නිලධාරිණියන් පෙනී සිටිය යුතුය. කාන්තා රැඳවියන් හා පුරුෂ ආරක්ෂක නිලධාරීන් අතර යම් කිසි ආකාරයේ සන්නිවේදනයක් සිදුවන්නේ නම් එය කාන්තා ආරක්ෂක නිලධාරිණියන් ඉදිරියේ නොමැතිව සිදු නොවිය යුතුය.

23) සිරභාරයට ගනු ලබන පුද්ගලයෙකුගේ දැරුවන් රැක බලාගැනීමට සිටින එකම පුද්ගලයා ඔහු හෝ ඇය නම්, සිරභාරයට ගැනීමෙන් පසු එම දරුවන් නිවසේ තනි නොකළ යුතුය. ඔවුන් යෝග්‍ය වැඩිහිටියෙකුගේ රැකවරණය යටතේ තැබිය යුතුය. සිරභාරයට ගත් වහාම තම රැකවරණය යටතේ සිටින දරුවන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය කටයුතු සැළසීම සඳහා එසේ සිරභාරයට ගත් පුද්ගලයාහට අවසරය තිබිය යුතු අතර ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදිය යුතුය.

24) මව සමඟ දරුවා සිරගත කොට ඇති විටකදී එම තත්වය ශාරීරික හෝ මානසික වධහිංසා හෝ පීඩා කිරීම සඳහා යොදා නොගත යුතුය. දරුවා මවගෙන් වෙන් කිරීම කළහොත් ඒ පිළිබඳ මව වහා දැනුවත් කළ යුතු අතර, නිරන්තරයෙන් දරුවා පිළිබඳ තොරතුරු දැනුවත් කිරීම කළ යුතුය.

## IV <u>*මානව හිමිකම් කොමිෂන් සභාවේ බලතල*</u>

25) 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 28(2) වගන්තියෙහි දක්වා ඇති ආකාරයට ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් හෝ කොමිෂන් සභාවේ බලය පැවරූ ඕනෑම අයෙකුහට, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිරභාරයට ගනු ලැබූ හෝ පුද්ගලයෙකු වෙත ප්‍රවේශවීම සඳහා අවසර ලබාදිය යුතුය. එමෙන්ම පුද්ගලයින් රඳවා තබාගන්නා ඕනෑම ස්ථානයක්, පොලිස් ස්ථානයක් හෝ භාරකාරත්වය යටතේ හෝ සිරගත කිරීම මඟින් පුද්ගලයන් රඳවා තබාගන්නා ඕනෑම ස්ථානයකට ඕනෑම අවස්ථාවක ප්‍රවේශවීම සඳහා අවසර ලබාදිය යුතුය.

26) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ වගන්ති 28 (1) හි දක්වා ඇති ආකාරයට, යම්කිසි පුද්ගලයෙකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිරභාරයට ගනු ලැබීම හෝ රඳවා තබාගැනීම සිදුකිරීමේ දී, ඒ පිළිබඳව නොපමාව හෝ සිරභාරයට ගනු ලැබීම හෝ රඳවා තබාගැනීම සිදුකොට පැය 48 ක් ගතවීමට පෙර එසේ සිරභාරයට ගනු ලැබීම හෝ රඳවා තබාගැනීම පිළිබඳ සහ එම පුද්ගලයා රඳවා තබා ඇති හෝ සිරගත කොට ඇති ස්ථානය පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කිරීම එසේ සිරභාරයට ගනු ලැබීම කරනු ලබන හෝ රඳවා තබාගැනීමේ නියෝගය දෙනු ලබන පුද්ගලයාගේ යුතුකම වන්නේ ය.

27) එහිදී එසේ රඳවාගෙන සිටින පුද්ගලයා වෙනත් රැඳවුම් මධ්‍යස්ථානයකට මාරුකිරීම හෝ නිදහස් කිරීම කළහොත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ වගන්ති 28 (1) හි දක්වා ඇති ආකාරයට, එම ස්ථාන මාරුකිරීම හෝ නිදහස් කිරීම පිළිබඳ හා රඳවා තබාගැනීම සිදුකරන නව ස්ථානය පිළිබඳ පැය 48 ක කාලයක් ඇතුළත කොමිසමට දැනුම්දීම එසේ ස්ථාන මාරුකිරීම හෝ නිදහස් කිරීම පිළිබඳ තීරණය ගනු ලබන පුද්ගලයාගේ යුතුකම වන්නේ ය.